ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඖෂධවේදී (MA 2.1) III වන ශ්‍රේණිය

වෘත්තීය සුදුසුකම්

අ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද ඖෂධවේදියකු ලෙස වූ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ලියාපදිංචි සහතිකය සමග, රජයේ/ සංස්ථාවක/ මණ්ඩලයක/ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයකට අයත් ලියාපදිංචි ඔසුසලක ඖෂධ සංයෝජක කාර්යයන්හි අවම වශයෙන් වසර එකක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

සහ

ආ) පරිඝණක සාක්ෂරතාවය

වැටුප් පරිමාණය	රු. 37,890/-, 375/- X 10, 440 /- X 7, 620/- X 4, 825/- X 20 - 63,700/- (දළ මාසික වේතනය රු. 115,914/- ක් පමණ වනු ඇත) (ඒ සඳහා මූලික වැටුප, ඖෂධ ආරක්ෂණ දීමනාව, කාර්යසාධන දීමනාව, ප්‍රවාහන දීමනා හා විශේෂ දීමනාව ඇතුළත් වනු ඇත.)
වයස් සීමාව	වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය

ii. තනතුරේ රාජකාරි නිසියාකාරව කිරීමට අවශ්‍ය කායික හා මානසික ශක්තිය තිබිය යුතුය.

iii. සුපිලිපන් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

තෝරාගත් අයදුම්කරුවන් හට ඉහත මාසික දීමනාවන්වලට අමතරව පහත සඳහන් ආකර්ෂණීය අනෙකුත් ප්‍රතිලාභ හිමිවනු ඇත.

- මාසික පැමිණීමේ දිරි දීමනාව,
- ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය,
- වාර්ෂික ප්‍රසාද දීමනා,
- වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයාට හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය
- දිවා ආහාර දීමනාව

බඳවා ගැනීමේ ක්‍රියාවලිය

1. අයදුම්කරුවන් විසින් තම වයස, අධ්‍යාපන සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වර්තමාන තනතුර, වැටුප් පියවර හා වැටුප් පරිමාණය මීට පෙර දැරූ තනතුරු, පෙර සේවායෝජකයන් වෙත සේවයට එක් වූ හා සේවයෙන් ඉවත් වූ දිනයන් ඇතුළත් වන පරිදි තමන් විසින්ම සකස් කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. එසේම ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, අදාළ සහතිකපත්වල පිටපත් හා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද ඉදිරිපත් කළ යුතුය. අදාළ සහතිකපත්වල පිටපත් නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.
2. රාජ්‍ය/ සංස්ථා/ මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.
3. පොදු කොන්දේසි
   - අයදුම්කරුවන් විසින් තනතුරක් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයෙකු ලෙස සලකනු ලබන්නේ, අවශ්‍ය සියලු සුදුසුකම් 2026.11.23 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබේ නම් පමණි.
   - අයදුම්කරුවන් සතුටුදායක සේවා කාලයකින් හෙබි විය යුතුය.
   - අයදුම්පතෙහි සපයා ඇති සියලු තොරතුරු නිවැරදි හා සම්පූර්ණ බවට අයදුම්කරුවන් විසින් තහවුරු කළ යුතුය.
   - ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
   - අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අයදුම්පත් කැඳවීමෙන් පසුව ලිඛිත පරීක්ෂණයක හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
   - මෙම දැන්වීමෙන් ආවරණය නොවන ඕනෑම කරුණක් හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය අතරතුර පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර එම තීරණය අවසන් තීරණය වනු ඇත.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2026 නොවැම්බර් 23
අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය, ලියාපදිංචි තැපෑලෙන් 2026.11.23 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) වැ.ඔ,
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,
" මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41,
කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන අංකය 0112 320 356 -9